

# මම විශ්‍රාමිකයෙක් වුණේ විශ්‍රාම වයසට අවුරුදු දහනවයකට කලින්.

## රත්න ශ්‍රී විජේසිංහ

**මේ වෙනකොට කොහොමද ජීවිතේ ගතවෙන්නේ ?**
විශ්‍රාමිකයෙක් විදිහට ගෙදරට වෙලා ඉන්නවා. දරුවන්ගේ වැඩකටයුතු ගැන හොයලා බලලා ඒ අයටත් පුළුවන් උදව්වක් දෙනවා. මානසික විවේකය ලැබෙන විදිහට ලියන එකත් කරනවා.

**විශ්‍රාමිකයෙක් වුණාම තියන නිදහස, සැහැල්ලුව ලේඛන කටයුතුවලට ලොකු රුකුලක් වෙලා ඇති නේද ?**
මට වෙලා තියෙන්නේ නම් ඕකේ අනෙක් පැත්ත. මම විශ්‍රාමිකයෙක් වුණේ විශ්‍රාම වයසට අවුරුදු දහනවයකට කලින්. එහෙම නොවුණානම් තවමත් මම රැකියාවේ. අදටත් මගේ විශ්‍රාම වයසට තව අවුරුදු තුනක් තියනවා. විශ්‍රාම යන කොට මගේ වැටුප රුපියල් විසිහත් දාහයි. ඒ වැටුපට අද ලැබෙන විශ්‍රාම වැටුප ඉතාම සුළු එකක්. මේ වෙනකොට මම රැකියාවේ හිටියා නම් වැටුප හැත්තෑපන් දාහක් විතර වෙනවා. එහෙම වෙලා නිසි විදිහට විශ්‍රාම ගියානම් ලැබෙන විශ්‍රාම වැටුප අද ජීවත්වෙන්න ප්‍රමාණවත් එකක් වෙන්න තිබුණා. එහෙම වුණානම් ආර්ථික ප්‍රශ්ණ අඩුවෙන කොට හිතට දැනෙන නිදහස, සැහැල්ලුව ඔබ ඔය කියන විදිහට ලේඛන කටයුතුවලට රුකුලක් වෙන්නත් තිබුණා.

**නොකල්හි විශ්‍රාම යන්නට සිදුවීමේ නොකියූ කතාව කියන්න අකැමතිද ?**
අකැමැත්තක් නම් නෑ. ඒත් ඕව ඉතිං කියලා වැඩකුත් නෑ. මම එස් බී දිසානායකගේ සමෘද්ධි අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් විදිහට ඉන්න කාලේ තමයි එස් බී අර ශ්‍රේෂ්ඨාධිකරණයට අපහාස කළා කියන කතාව කළේ. මේ කතාව වීඩියෝ කරලා තිබුණේ මගේ ළග වැඩකරපු කැමරා ශිල්පියෙක්. පස්සේ එස් බී ආණ්ඩුවෙන් අයින් වෙලා එක්සත් ජාතික පක්ෂයට ගියාම එස් බී ට විරුද්ධව ශ්‍රේෂ්ඨාධිකරණයට අපහාස කළා කියලා නඩු පවරන්න සාක්ෂියට තිබුණේ මේ වීඩියෝ පටිය. මේ පළාතේ පැරෂුට් දේශපාලක චරිතයක් මේ කැමරා ශිල්පියාව චන්ද්‍රිකා ළගට එක්ක ගිහිල්ලා මේ ගැන කතා කරලා තියනවා. ශිල්පියා ඔරිජිනල් වීඩියෝ පටිය තියාගන ඒකෙ කොපි එකක් චන්ද්‍රිකාට දීලා තියනවා. ඒ වෙනුවෙන් ඔහුට රූපවාහිනී සංස්ථාවේ ස්ථිර රැකියාවක් ලබාදීලා තියනවා. පස්සේ නඩුව යනකොට එස් බී ගේ පැත්තෙන් අධිකරණයට කිව්වා මේ වීඩියෝ පටිය ඔරිජිනල් එක නෙවෙයි. ඔරිජිනල් එකේ තියෙන්නේ ඔය කතාව නෙවෙයි කියලා. ඒ නිසා අර පැරෂුට් දේශපාලකයා ආයෙත් කැමරා ශිල්පියා චන්ද්‍රිකා ළගට එක්ක ගියාම මිනිහා කියලා තියනවා ඔරිජිනල් එක එස් බී ට දුන්නා කියලා. ඇයි එහෙම කළේ කියලා ඇහුවම රත්න ශ්‍රී මහත්තයා දෙන්න කියලා කිව්ව නිසා දුන්නා කියලා. නමුත් මම ඒ ගැන කිසි දෙයක් දැනගෙන හිටියේ නෑ. පහුවදාම චෝදනා පත්‍රයක්වත් නැතුව මගේ වැඩ නැවැත්තුවා. පස්සේ තමයි මට මේ කතාව දැනගන්න ලැබුණේ. පස්සේ කාලයක් පඩිත් නැතුව රස්සාවත් නැතුව හිටියා. මහින්ද අගමැති වුණාට පස්සේ කැබිනට් පේපර් එකක් දාලා විශ්‍රම වැටුපක් හදලා දුන්නා.

**මහින්ද රාජපක්ෂ ජනාධිපති පුටුවට ගේන්න දර දිය ඇදපු කලාකරුවන් අතරේ ඔබත් ඉදිරියෙන්ම ඉන්නවා. අදටත් ඇතැම් අවස්ථාවල ජනාධිපතිවරයාගේ කතා ඔබේ පෑනෙන් ලියැවෙනවා නේද ? ඉතිං මහින්ද ජනාධිපති වුණාට පස්සේ ඔබ වෙනුවෙන් මොකක්ද කළේ ?**
එහෙම මොකක්වත් වුණේ නම් නෑ. මම උදව් කළේ එහෙම දේවල් බලාපොරොත්තුවෙනුත් නෙවෙයි. මම කතා කීපයක් ලියලා දීලා තියනවා තමයි. ඒවා කෙරෙන්නේ ජනාධිපති මාධ්‍ය ඒකකයේ ඉල්ලීමට ඒක හරහානේ. ඒ නිසා තමන් කරන කතාව ලිව්වේ කවුද කියලා එතුමට දැනගන්න ලැබෙන්නෙත් නෑ.

**ලියන කියන වැඩ කටයුතු එහෙම කොහොමද ?**
මගේ හත්වෙනි කවිපොත 'සන්ධ්‍යා තීර්තය' කියලා මේ වෙනකොට මුද්‍රණය වෙමින් තියනවා. හෙට අනිද්දා ඒක පිටවෙනවා. ගීත පොත් හයක් පළවෙලා තියනවා. තව ගීත ගොඩක් තියනවා පළකරන්න. නමුත් මගේ අදහසක් නෑ ඒකට. වෙනත් පොත් දහයක් විතර ඒ වගේම ළමා කතා දහයක් විතර ලියලා තියනවා.
ලියන්න තව ගොඩක් දේවල් තියනවා. ඒත් විවේකය පිළිබඳ පොඩි ප්‍රශ්ණයක් තියනවා. පොඩි විශ්‍රාම වැටුපකින් ජීවත්වීම පිළිබඳ ප්‍රශ්ණයකුත් තියනවා. මගේ දුවලා දෙන්නත් ලොකු රස්සාවල් කරන අය නෙවෙයි. ඒ අය ගැනත් මට බලන්න වෙ[ලා] තියනවා.

**පොත් ලියන එකෙන් ලැබෙන ආදායම කොහොමද ?**
පොත් ලිව්වා කියලා ඒකෙන් ප්‍රමාණවත් ආර්ථික වාසියක් ලැබෙන්නේ නෑ. මේ වගේ රටක පොත් ලියලා කෙනෙකුට ජීවත්වෙන්න අමාරුයි. සිංහලපොත් කියවන පිරිස බොහොම අඩුයි. කවි පොත් කියන ඒවා ප්‍රකාශකයන් බාරගන්නේවත් නෑ. බාරගත්තත් පොතකින් දෙසිය පනහයි වැඩිම වුණොත් පන්සීයයි ගහන්නේ. මගේ කවි පොත් නම් අවුරුද්දක් දෙකක් ඇතුළත පිටපත් දාහක් විතර විකිනෙනවා. නමුත් කර්තෘභාගය සීයට දහයක් වුණාම මේවායෙන් විශාල ආදායමක් ලැබනේනේ නෑ. ඉංග්‍රීසි පොතකින් නම් පිටපත් ලක්ෂ ගානක් මුද්‍රණය කරනවානේ. ඒ නිසා ඉංග්‍රීසි ලේඛකයන්ට වගේ සිංහල ලේඛකයන්ට පොත් ලියලා ජීවත්වෙන්න බෑ.

**ඔබගේ නිර්මාණවල ආවේනික ලක්ෂණයක් විදිහට දකින්න තියෙන්නේ දුක, කදුළ, වේදනාව, වියෝව වගේ එක්තරා ආකාරයකින් ඍණාත්මක දේවල්. ඇයි එහෙම වෙන්නේ ?**
හැම දේටම කලින් මම මට අවංක වෙන්න එපායැ. මම ජීවිතේ වැඩිපුර විදින්නේ දුක නම් මට කතාකරන්න වෙන්නේ දුක ගැන තමයි. කවදාවත් මට ස්පර්ශ කරන්න බැරිවුණ සංතෝෂයක් ගැන මම කොහොමද කියන්නේ. එහෙම කළොත් ඒක ව්‍යාජ එකක් වෙනවානේ. මගේ ජීවිතේ හුගාක්ම දුක විඳපු නිසා එහෙම වෙන්න ඇති කියලා තමයි මට කියන්න තියෙන්නේ.

**ළමා කාලය දෙමව්පියන් පවුල් පසුබිම ගැන මතකයන් අවදි කළොත් ?**
උණ සන්නිපාතය වගේ අසනීපයක් හැදිලා මගේ අම්මා නැතිවෙනකොට මගේ වයස මාස දහතුනයි. අම්මගේ වයස අවුරුදු දහනවයයි මාස පහයි. අම්ම ගැන මට කිසිම මතකයක් නෑ. මගේ මතකයේ තියෙන්නේ මගුල් පොටෝ එකේ අම්මගේ පින්තූරය විතරයි. මට අවුරුදු හතක් වෙද්දී මගේ තාත්තා නැතිවුණා. තාත්තා ගැනත් විශාල මතකයක් මට නෑ. මම හිතන්නේ තාත්තාත් මගේ ජීවිතේට ලොකු බලපෑමක් කරලා නෑ. අම්මා නැතිවුණාට පස්සේ තාත්තා මාවත් අරගෙන ඇල්පිටියේ තාත්තගේ ගමට යන්න ලෑස්තිවෙලා තියනවා. නමුත් ආත්තම්ලා සීයලා මාමල නැන්දල අවට හිටිය ඥාතීන් තාත්තට යන්න නොදී වළක්වගෙන අම්මගේ අක්ක කසාද බන්දල දීලා තියනවා. ඒ කසාදෙන් මට නංගිලා දෙන්නෙක් ඉන්නවා. පස්සේ ලොකු අම්මත් නැතිවෙනවා. මම හැදුනේ වැඩුනේ මාමලා නැන්දලා අතරේ. ඒ අයගේ ගෙවල් තිබුණේ එක ළග. ඒ අය මාව ආදරයෙන් බලාගත්තා. මට මතකයක් නැතිවුණාත් තාත්තා නැතිවීම කියන එක මගේ අභ්‍යන්රයේ ඇති. මොකද තාත්තා කෙනෙක් දරුවෙකුගේ පෞර්ෂයට බලපෑමක් කෙරෙනවානේ.

**කවි ලියන්න පටන් ගන්නේ මොන කාලෙද ?**
ශිෂ්‍යත්වෙ පාස්වෙලා මම හික්කඩුවේ ශ්‍රී සුමංගලයට ඇතුළු වෙන කොට මට වයස අවුරුදු දහයක් වගේ. හොස්ටල් එකේ නැවතිලා තමයි ඉගෙන ගත්තේ. මට මතකයි හොස්ටල් එකේ නවත්තන්න එක්ක යනකොට කොට්ට තුනක් අරගෙන ගියා ඇදේ තුන් පැත්තෙන් තියන්න වැටෙනවාට. එච්චරම පුංචියි මම. හරිම අමාරුවෙන් තමයි මම ගිහිල්ලා හොස්ටල් එකේ හිටියේ. ඒ හුදකලාව පාළුවත් එක්ක තමයි මම හිතන්නේ මම හුගක් පොත පත කියවන්න පෙළඹුණේ. අවුරුදු

සංවාදය සහ සේයා රූ
**ශ්‍රීලාල් සෙනෙවිරත්න**

දහය එකොළහේදී මම දරුවෙකුට ඔරොත්තු නොදෙන තරම් පොත් කියවලා තියනවා. ලියන්න පෙළඹෙන්නෙත් මේ හුදකලාවයි තනිකමයි පාලුවයි එක්ක. අවුරුදු එකොළහේදී මම කවියක් ලියනවා ඒ කාලේ තිබුණ ගීතාංජලී කියන කවි පත්තරේට. ඒක දවස නිවසින් ප්‍රකාශයට පත්කළේ. ඔය පත්තරේ මුල් පිටුවේ තියනවා පින්තූරයක්. ඇතුළේ තියනවා කූපනයක් මේ පින්තූරයට කිවියක් ලියලා යවන්න. ගීතාංජලී එක කළාපයක මුල් පිටුවේ තිබුණා ගෑණු කෙනෙක් කූඩයක් තියාගන කොල්ලෑවක් තියන ඔරුවක නැගිලා ඉන්නවා. මම ඒකට කවියක් ලියලා යැව්වා. ඔය කවියට මට රුපියල් විසිපහක තෑග්ගක් හම්බවුණා. ප්‍රින්සිපල් මාව එසෙම්බ්ලියෙ ඉස්සරහට ගෙනල්ලා කවිය කියවලා බොහෝම



## රත්න ශ්‍රී

දක්ෂිණ ලංකාවේ ප්‍රමුඛ පුර, ගාල්ල නගරයෙන් කිලෝ මීටර දාහතරක් ඔබ්බෙහි පිහිටි තෙල්ලඹුරේ ග්‍රාමයේ විසූ සුළු ඉඩම් හිමි වැවිලිකරුවෙකු වූ විජේසිංහ ආරච්චිගේ ඔල්ටර් මෙන්ඩිස් විජේසිංහට දාව පොල්පාගොඩ මැණික් හාමිනේ තරුණ මව 1953 ජුනි 02 දින බිහි කළ කුළුදුල් පිරිමි දරුවා 'රත්න ශ්‍රී' නම් ලැබීය. දෛවෝපගත ලෙස පැටි වියේදීම මවත් පියත් දෙදෙනාගෙන් වියෝව හුදකලාවන්නට සිදුවූ මේ දරුවා සිය මූලික අධ්‍යාපනය ලැබුවේ තෙල්ලඹුරේ දුටුගැමුණු මහා විද්‍යාලයෙනි. කුඩා අවධියේ සිටම විෂයගත අධ්‍යාපනයේ කුසළතා පළකළ හේ පහේ ශිෂ්‍යත්ව විභාගයෙන් සමත් වූයෙන් ඉදිරි අධ්‍යාපන කටයුතු සඳහා හික්කඩුව ශ්‍රී සුමංගල මධ්‍ය මහා විද්‍යාලයට ඇතුළත් කෙරුණු අතර පසුව ගාල්ල රිච්මන්ඩ් විද්‍යාලයට ඇතුළත්ව ජීව විද්‍යා අංශයෙන් උසස් පෙළ අධ්‍යාපනය ලැබුවේය.

පාසල් අධ්‍යාපනය හමාර කළ රත්න ශ්‍රී විද්‍යා හා ගණිත ගුරුවරයෙකු ලෙස වෘත්තීය ජීවිතය ආරම්භ කළේ් සිය ගම් පළාතේම පාසලක් වූ නැවුම්ගල කණිටු විද්‍යාලයෙනි. ගුරු වෘත්තියේ නිරතව සිටියදීම පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ ශාස්ත්‍ර පීඨයේ බාහිර උපාධි අපේක්ෂකයෙකු ලෙස ලියාපදිංචි වන හෙතෙම පන්ති සාමාර්ථයක් සහිතව ශාස්ත්‍රවේදී උපාධිය ලබාගන්නේ පොත්පත් කියවමින් ලබූ ස්වයං අධ්‍යාපනයක පිහිටෙනි. පසුව කැළණිය විශ්වවිද්‍යාලයෙන් ශාස්ත්‍රපති උපාධියද ලබන රත්න ශ්‍රී, ගුරු උපදේශක තනතුරකට පත්කෙරෙන අතර අනතුරුව කලක් ගුරු අභ්‍යාස විද්‍යාලයේ කථිකාචාර්යවරයෙකු ලෙසද කටයුතු කළේය. සිසු අවධියේ සිටම දේශපාලන ක්‍රියාකාරීකයෙකු ලෙසද විවිධ කටයුතුවල නියැළී හෙතෙම එහිදී ඇතිවූ දේශපාලක ඇසුරේ ප්‍රතිඵලයක් ලෙස 1994 වසරේදී ගුරු වෘත්තියට සමුදී ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරයෙකු ලෙස රාජ්‍ය සේවයට එක්විය. එම ධූරය දරමින් අමාත්‍යාංශ හතරක සේවය කළ රත්න ශ්‍රී පසුව දේශපාලන හේතූ මත සේවයෙන් ඉවත් කරන ලද අතර එදා මෙදා තුර දේශපාලන බල අධිකාරියේ බොහෝ වෙනස්කම් සිදුවී ඇතත් මේ දක්වාත් ඔහු වෙනුවෙන් සාදාරණත්වයක් ඉටුවී නොමැත.

පාසල් අවධියේ සිටම කාව්‍ය නිර්මාණයේ දක්ෂයෙකු වූ රත්න ශ්‍රී සිය ප්‍රථම කාව්‍ය සංග්‍රහය 1979 වසරේදී 'බිය නොවන් අයියන්ඩි' මැයෙන් ප්‍රකාශයට පත්කරනු ලැබුවේය. පසුව 1985 වසරේදී 'වස්සානේ', 1988 දී 'සුබ උදෑසන', 1996 දී 'සල්ගහ යට' යන කෘතීක්ද ඇතුළත්ව කාව්‍ය කෘතීන් හයක් ප්‍රකාශයට පත්කරමින් කවි පද බැදීමේ සිය ප්‍රතිභාව වඩාත් ප්‍රකට කළේය. කවියෙකු ලෙස සහෘද හදවත් සියුම්ව ස්පර්ශ කරන රත්න ශ්‍රී, කවි පබඳින අතර ගේය පද රචනයෙහිද නියැළුනේය. 'වංක ගිරිය අරනේ (1990), සුදු නෙළුම (1993), ගංගා ගීතය (1995), ඔහුගේ ගේය පද රචනා සමුච්ඡයන්ය. මහාචාර්ය සුචරිත ගම්ලත් හා එක්ව 'මහගම සේකර සහ සමාජ යථාර්ථය' මැයෙන් ශාස්ත්‍රීය කෘතියක්ද, ළමා සාහිත්‍ය පොත් ගණනාවක්ද ඇතුළුව මේ වන විට පොත් 34 ක් ප්‍රකාශයට පත්කර ඇති රත්න ශ්‍රී ගේ රචනා බොහෝ වාර ගණනක් රාජ්‍ය සාහිත්‍ය සම්මාන ද ඇතුළුව විවිධ සාහිත්‍ය සම්මානයන්ගෙන් ඇගැයීමට ලක්ව තිබේ. 'සුදු නෙළුම', 'වංක ගිරි අරණෙ', 'නෙත නිළුපුල්', 'ආලකමන්දාව' ගී පොත් හතරත් 'සුබ උදෑසන' කවි පොතත්, 'සින්දු කියන උණ පදුර' ළමා සාහිත්‍ය පොතත් රාජ්‍ය සම්මානයට පාත්‍රවූ පොත්ය. රාජ්‍ය ටෙලි සම්මාන, සුමති සම්මාන, සරසවි සම්මානද හෙතෙම ලද සෙසු සම්මාන අතර වේ.

මෙලෙස සපැමිණි මාවත අවසන හේ හෙළ පද්‍ය හා ගේය කාව්‍ය සාහිත්‍යයේ නාමධාරී නිර්මාණකරුවන් අතර රත්න ශ්‍රී විජේසිංහ නමින් සිය අනන්‍යතාවය සළකුණු කරනු ලැබූ අතර අදටත් ගාලු කොටුවේ පිහිටි සිය බිරියගේ නිවෙසේ හුදකලාව දවසේ වැඩි කාලයක් ගෙවා දමමින් සිටින්නේ විවිධ සාහිත්‍ය නිර්මාණ කටයුතුවල යෙදෙමිනි.